## හද්දා පිටිසර මහවිලච්චියේ දරුවන්ට අන්තර්ජාලයේ දොරටු විවර කළ අපූරු ගුරුවරයා

ඉපදී හැදී වැඩුණු හද්දාපිටිසර ගම්මානයට, එහි දිවිගෙවන මිනිසුන්ට ආදරය කළ තරුණ ගුරුවරයකු ඒ ගම්මානය වෙනුවෙන් අපූරු මෙහෙවරක් ඉටුකරන්නට සමත් වී ඇත.මේ අපූරු ගුරුවරයා තිස්තුන් වියේ පසුවන නන්දසිරි වන්නිනායක මහතා වෙයි. මන්නාරම් දිස්ත්‍රික්කයටත්, විල්පත්තුව වනෝද්‍යානයටත් මායිම් වෙන මෙම හද්දා පිටිසර අති දුෂ්කර ගම්මානය මහ විලච්චිය වෙයි. "මහා වැවක්" පිහිටා තිබීම නිසා විනා අනුරාධපුරයේ සිටද කි.මී.50 කට ආසන්න දුරින් පිහිටා ඇති මහ විලච්චිය වෙනත් කිසිදු ආකාරයකින් ප්‍රසිද්ධියකට පත් නොවූ ගම්මානයකි. එහෙත් අද ඒ තත්ත්වය උඩු යටිකුරු වී තිබේ.



මේ දුෂ්කර ගම්මානයේ සියයට අනූවක් පමණ ජනතාවගේ ජීවනෝපාය ගොවිතැනයි. මහවිලච්චිය වැවට පින්සිදුවන්නට ගොවිතැනක් බතක් කරගෙන ජීවිත ගැට ගසා ගන්නවාට වඩා රටේ ආර්ථිකයේ දර්ශකයක් වීමට මොවුනට ඉඩකඩ සලසා දී නොමැත.මහවිලච්චියේ උපන් වන්නිනායක තරුණයා කිසිවෙකුට ඇඟිල්ල දිගුකරන්නට නොගියේය. අදුරට ශාප නොකළ ඔහු කෙසේ හෝ ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගන්නට වෙර දැරුවේය. ඊට පහසුකම් තිබුණේ අනුරාධපුර නගරයේය.

නගරයට යාම තරමක් දුෂ්කර කාරයයකි. ගමේ සම්පත්වලින්ම උපරිම ප්‍රයෝජන ගත යුතුය. "වන්නි" කටුක අත්දැකීම් රැසකට මුහුණ දී ගමේදීම ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා ගත්තේය. තමා කළාක් මෙන් දුෂ්කර ක්‍රියා තවත් අය කරාවිද? එත් ගමේ දරුවන් ඉදිරියට යා යුතු නොවේද? "වන්නි" තනිවම තරක කළේය.ගමේ සාලිය අශෝකමාලා විදුහලට නන්දසිරි වන්නිනායක ඉංග්‍රීසි ගුරුවරයා පත්වීමක් හදාගෙන ආවේය. පාසලේ දරුවන්ගේ ප්‍රියතම විෂය බවට ඉංග්‍රීසි විෂය පත්කරන්නට ඔහු මහත් වෙහෙසක් ගත්තේය. "දරුවන්නේ ජාත්‍යන්තර භාෂාවකින් ලෝකයට පිවිසෙන අපිට නව තාකෂණය කජ්ජක් නොවේ. "වන්නි"දැඉංගිරිසි මහත්තයා" පරිගණක තාකෂණයක්" පිළිබඳව කියන විට පාසලේ දූ දරුවෝ බණ මෙන් අසා සිටින අයුරු "වන්නි"දැදුටුවේය.

"වන්නි" ඉංග්‍රීසි පුවත්පතකට ලිපියක් යොමු කළේය. ඇමෙරිකානු තානාපති කාර්යාලයෙන් "පරිගණකයක්" පරිත්‍යාග කෙරිණි.ඉංග්‍රීසි දැනුම ඇති පාසල් දරුවන්හට පරිගණක තාකෂ-ණය වැළඳ ගන්නට ඔහු අවස්ථාව උදාකර දුන්නේය. "ඉංග්‍රීසියි පරිගණකයයි" විතරක් කරලා පුළුවන්ද?" ආචාර්ය මණ්ඩලයේ පිරිසකට වන්නිනායකගේ මේ කටයුත්ත මහත් හිසරදයක් විය. පරිගණකයට ඇදී යන දරුවෝ වෙනත් අධ්‍යාපනික කටයුතුවලින් බැහැර වෙන බවට චෝදනාවක්ද විය.කෙසේ හෝ වේවා අවසානයේ ඉංග්‍රීසි ගුරුවරයාට අනුරාධපුරේදැනගරයට ස්ථාන මරුවක් ලැබිණ.අනුරාධපුර නගරයේ පාසල් දරුවන්ට ඉංග්‍රීසි, පරිගණක අධ්‍යාපනය ලබා ගැනීමට පහසුකම් තිබිණි.

නගරයේ පාසල් තුළ ගුරුවරු ඕනෑවටත් වඩා ගොඩගැසී සිටිති. ඇතැම් ගුරුවරුනට පාසලේ ඔහේ කාලය ගෙවා දමා යාමටද හැකියාව තිබිණි. ඒ අතරේ තම පෞද්ගලික පන්ති පවත්වා ගැනීමට සහ තමන්ගේ උසස්වීම් වෙනුවෙන් ඉහළට අධ්‍යාපනය ලබා ගන්නටත් හැකි-යාව, අවස්ථාව සැලසී තිබිණි,නමුත් වන්නිට තමන්ගේ ගමට සේවයක් කිරමේ වුවමනාව තදින්ම දැනී තිබුණි."අනේ අපේ ගමේ පැටවුන්ට......?" වන්නි ගුරුකම අනුරාධපුර නගරයේම තබා මහ විලච්චියේ ගෙදරට ගියේය. මුළුකාලයම ගමේ පැටවුනට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමට කැප කළේය. ගාස්තුවක් ලබාදිය හැකි ඇතැම් දරුවෝ එය ලබා දුන්නා. ඇතැම් දරුවන්ගෙන් ඒ ගාස්තුව වන්නි ලබා ගත්තේ නැත. නමුත් පරිගණක අධ්‍යාපනයට පහසුකම් නොවීය.

මේ අතර ඔහු විදේශගත විය. රැකියාවකින් යමක් සොයා ගනිමින් සිටියේය. ඒ අතරතුර ඔහුට ශ්‍රී ලාංකීය මිතුරන් කීප දෙනෙකු හමු විය. වන්නි තම ගමේ දරුවන්ට පරිගණක අධ්‍යාපනය ලබාදීමේ වුවමනාව ගැන ඔවුනට පැවසුවේය.ඔවුහු හැකි පමණින් ආධාර කරන්නට එකඟ වූහ.වන්නි ශ්‍රී ලංකාවට පැමිණි-යේය. නිවසට යා බදව අඩි 20X40 ක ගොඩනැගිල්ලක් තැනුවේය. මුළුදැවත්තේම ගස් වවා තිබුණි. ගස් සෙවනේ සහ මෙම ගොඩනැගිල්ල තුළ ගමේ දරුවෝ එකම පරිගණකයකින් නොමිලයේ අධ්‍යාපනය ලැබූ-වෝය.

වන්නි තම මෙහෙවර පිළි-බඳව සඳහන් කොට වෙබ් අඩවියක් නිර්මාණය කළේ මේ අතරතුරය. එංගලන්තයේ මරිස්සා චාල්ස් නම් මෙනෙවි-යක් මේ වෙබ් අඩවියේ වූ විස්තර දුටුවාය. ඒ විස්තර දැකීමෙන් ඇය තුළ මොනතරම් සංවේදී බවක් ඇතිවීද යත් ටික දිනකින්ම ලංකාවට පැමිණියාය.මරිස්සා මාස තුනක් ස්වේච්ඡාවෙන් මෙහි ඉගැනවූවාය. ඇය එංගලන්තයේ තම දෙමාපියන්ට මේ අපූරු කටයුත්ත පිළිබඳව ලියා යැව්වේ ආධාරකරන ලෙසටද ඉල්ලා සිටිමිනි.

මරිස්සාගේ දෙමාපියෝ ලංකා මුදලින් රුපියල් ලකෂ හැත්තෑවක් එම දියණියට ලබා දෙන්නට තරම් කාරුණික වූහ. මේ මුදලින් වෙනම ඉඩමක් මිලදී ගෙන දුන් මරිස්සා තට්ටු දෙකේ ගොඩනැගිල්ලක්ද ඉදිකරවා අන්තර්ජාලය සඳහා දුරකතන සංඥා ලබාගැනීමට සංඥා කුළුණක්ද ඉදිකරවා දුන් "හොරයිසන් ලංකා පදනම" නමින් අද මේ ගැමි දරුවන්ට පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දෙන මධ්‍යස්ථානය එයයි.

මෙම පදනම මගින් වන්නි රජයේ "නැණසල" වැඩසටහනට 2003 වසරේදී ව්‍යාපෘතියක් ඉදිරිපත් කළේය. මධ්‍යස්ථානයට රජයෙන් සහයෝගය ලැබුණේ ඒ අනුවය. පැය 24 පුරා අන්තර්ජාල පහසුකම් මහ විලච්චියට ලැබිණ. ජනාධිපති ලේකම් කාර්යාලයට අනුබද්ධිත අයි.සී.-ටී.ඒ. ආයතනය මසකට රුපියල් විසිතුන්දහසක් එම අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් ලංකා කොම් ආයතනයට ගෙවමින් සිටී. හොරයිසන් ලංකා පදනම මහවිලච්චිය අති දුෂ්කර ගම්මානයට මෙම අන්තර්ජාල පහසුකම් නොමිලයේ ලබා දෙයි.

"වයි - ෆයි" යනු ලෝකයේ දැනට පවතින දියුණුතම අන්තර්ජාල තාකෂණ විධියයි.රැහැන් රහිත අන්තර්ජාල පහසුකම එයයි. වයි - ෆයි පහසුකම් සහිත ජංගම දුර-කතන හෝ පරිගණක භාවිතා කොට වයි - ෆයි කලාපයක් තුළදී අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමට හැකියාව ඇත.මුළු ශ්‍රී ලංකාව තුළම පවා මෙම කලාප ඇත්තේ සීමිත සංඛ්‍යාවකි. සැබැවින්ම අනුරාධපුර නගරයට පවා මෙම කලාපයක් නොමැත. නමුත් අද වන විට මහවිලච්චිය හොරයිසන් ලංකා පදනම මෙම ගම්මානය ආශ්‍රිතව එවැනි කලාප හතක් පිහිටුවා ඇත.ඉදිරියේදී ප්‍රධාන ස්ථාන සියයක් අන්තර්ජාල ආවරණ ලබා දීමට සැලසුම් කර තිබේ. දැනට මහවිලච්චිය රෝහල, පොලීසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එම කලාපවලින් බැහැරව පවතී. ඉදිරි සැලසුම අනුව එම ස්ථානවලටද පහසු-කම්

සැලසීමට නියමිතය. මේ වන විට ප්‍රදේශයේ සෑම නිවස-කටම පරිගණකයක් ලබා දීම-ටද සැලසුම්කර තිබේ.

පාසල් දරුවෝ දහසක් පමණ දැනටමත් මෙමගින් ප්‍රයෝජන ලබා ගනිති. ඔහෑජ ආයතනයේ ආධාරද ආයතනයට ලබාදී ඇත."වන්නි" තමන්ගේ ගම හැරදා නොගොස් මේ පිටිසර ගම්මානය විශ්ව ගම්මානය හා සම්බන්ධ කොට ඇත. දියුණු ලෝකය ජය ගන්නට තටුසලා පියෑඹීමට සූදානමින් සිටින මහ විලච්චිය ගමේ දූ දරුවන් අපට පෙනුනේ කුලෑටි කොල්ලන් කෙල්ලන් පිරිසක් ලෙසින් නොවේ. අපේ "වන්නිට" පින් සිදූ වන්නට දකෂතා පිරුණු, අනාගතයේ පහන් ටැඹවල් රැසක් ලෙසිනි.

විශේෂාංග
පිටු අංක 11

මුල් පිටුව